# යඨාලතිස්ස ආයකය පිළිබඳ මූලික අධ්‍යයනයක්

එස්. නිසංසලා කුමාරි

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

ප්‍රමුඛ පදඃ යඨාලතිස්ස, ස්තූපය, ආයකය, කැටයම්,

## හැඳින්වීම

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාමය නගරයේ යඨාලතිස්ස ස්තූපය පිහිටා තිබෙන අතර හම්බන්තොට කතරගම ප්‍රධාන මාර්ගයේ පිහිටා තිබේ. සඳගිරි වෙහෙර සහ තිස්සමහාරාමය මහා තූපයට පමණක් දෙවනිවන ස්තූපයක් වශයෙන් යඨාලතිස්ස ස්තූපය හැඳින්විය හැකිය. යඨාලතිස්ස පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ඉතාමත් වැදගත් පැරණිතම ගොඩනැගිල්ලක් වශයෙන් ස්තූපය පෙන්වා දිය හැකිය. යඨාලතිස්ස ආයකය පිළිබඳව මූලික වශයෙන් අධ්‍යයනය කිරීම අධ්‍යයන අරමුණ වශයෙන් පෙන්වා දිය හැකිය.

## ක්‍රමවේදය

අධ්‍යයන ක්‍රමවේදය යටතේ ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය කරමින් තොරතුරු වාර්තා කිරීම සිදු කරනු ලබයි. එමෙන්ම මූලික වශයෙන් සිදුකරන ලද කැණීම් සහ ගවේෂණ වාර්තාවන් අධ්‍යයනය කරනු ලබයි. එමෙන්ම වර්තමානයේ යඨාලතිස්ස කෞතුකාගාරය අධ්‍යයනය කරමින් .දත්ත රැස්කරනු ලැබේ. ඡායාරූප ගැනීම සහ දළ සැලසුම් නිර්මාණය කරමින් දත්ත වාර්තා කරනු ලබයි. දත්ත අර්ථකථනයේදී විශ්ලේෂිත සටහන් භාවිත කරනු ලබයි.

## ප්‍රතිඵල සහ සාකච්ඡා

මෙම පර්යේෂණයේ ප්‍රතිඵල සහ සාකච්ඡා වශයෙන් මෙහි චතුරස්‍රාකාර සළපතල මලුවක් දක්නට ලැබේ. අයකයේ කොටස් වර්තමානයේ කෞතුකාගාර භූමියේ තැන්පත් කර තිබේ. වර්තමානයේ සිදුකරන ලද කැණීම් මඟින් අනුරාධපුර යුගයේ ඉදිකරන ලද ස්තූප ආයක කොටස් හඳුනා ගැනීමට හැකියාව ලැබෙන නමුත් ක්ෂේත්‍රයේ ප්‍රකෘත්ති තත්ත්වයෙන් ආයකයන් දක්නට නොමැත. ස්තූපය කිහිප වතාවක් ප්‍රතිසංස්කරණය කර තිබෙන අතර මහානාග යුව රජතුමා විසින් ස්තූපය ඉදිකර තිබෙන බව සඳහන් කිරීමට හැකිය. මෙම ස්තූපය නිර්මාණය පිළිබඳව විවිධ ජනප්‍රවාදයන් හඳුනා ගැනීමට හැකිය. දැනට හමුව ඇති ආයක කොටස් අනුව නැගෙනහිර ආයකය වශයෙන් අනුමාන කිරීමට හැකිය. මෙහි මිරිසවැටිය ආයකය සහ සමාන ආයකයන් නිර්මාණය කර තිබෙනන්ට ඇතැයි අනුමාන කිරීමට හැකිය.

ආයකයන් අලංකාරය කිරීම සඳහා විවිධ කැටයම් සහ මෝස්තරයන් භාවිත කරන ලද අතර වර්තමානයේ කැටයම් සහිත ආයකයේ දෙපස ස්ථම්භ කොටස් දෙකක් පමණක් හඳුනා ගැනීමට හැකිය. ඒවා දැනට යඨාලතිස්ස පුරාවිද්‍යා කෞතුකාගාරයේ ප්‍රවේශ දොරටුව අසල තබා ඇත. ඡායාරූප අංක 01 සහ අංක 02 දෙකෙහි දක්නට ලැබෙන මානව රූපයන් නෙළුම් පුෂ්පයක් මත හිඳ සිටී. දකුණතින් අභය මුද්‍රාව නිරූපණය කරනු ලබයි. වම් අත ඉනෙහි තබාගෙන සිටී. පපු ප්‍රදේශය හරහා පූන නූලක් වම් උරයේ සිට දකුණතේ ඉට ආසන්යෙන්

අවසානවන ආකාරයට නිරූපණය කර තිබෙනු දක්නට ලැබේ. යටිකය ඇඳුම පැහැදිලිව හඳුනා ගැනීමට නොහැකි අතර උඩුකය නග්නව සිටී. බොහෝදුරට ආන්ධ්‍ර කැටයම් ආභාසය නිරූපණය කරනු ලබන බව පැවසිය හැකිය. අතෙහි දක්නට ලැබෙන වළලු පන්ති ආදිය දෙස අවදානය යොමු කිරීමේදී ආන්ධ්‍ර කලා ලක්ෂණයන් මැනවින් ප්‍රකට වේ.කර්ණාබරණ, බෙල්ලේ, බාහුවේ මෙන්ම අතේ මැණික් කටුවෙහි ආභරණ පැළඳ සිටි. ආභරණවල විවිධ වෙනස්කම් දක්නට ලැබෙන බව පැවසිය හැකිය. මෙම කැටයම් ද්විත්වය කුවේර කැටයම් යනුවෙන් අනුමාන කිරීමට හැකිය.

කැටයම් එළකයන් හි එක් පැත්තකින් කුවේර යැයි අනුමාන කිරීමට හැකිවන මෙම කැටයම දක්නට ලැබෙන අතර අනෙක් පැත්තතේ ලතා මොස්තරයක් දක්නට ඇත. අශ්වයා සහ ඇතුන් දෙදෙනා බැගින් නිරූපණය කර තිබෙන බව පැවසිය හැකිය. ලතා මොස්තරයක් අවසානයේ සිංහයෙකුගේ රූපයක් කැටයම් කර ඇත.(ඡායාරූප අංක 03 සහ 04) එසේම ආයකයේ කැටයම් අතර තිබෙන්නට ඇතැයි අනුමාන කරනු ලබන ස්ත්‍රී වාමන රූපයක් සහ පුරුෂ වාමාන රූපයක් මේ ආශ්‍රිතව තිබී හඳුනා ගෙන ඇත. එසේම මෙම කැටයම් දෙකෙහි පිටුපස ආයකට රඳවා ඇති ආකාරයක් හඳුනා ගැනීමට හැකිය. වර්තමානයේ මෙම කැටයම් සහිත කැටයම් එලයන් කෞතුකාගාරයේ තැන්පත් කර තිබේ. මෙම ආයක කොටස් නිසි ආකාරයෙන් හඳුනා ගනිමින් වාර්ත කරමින් නිසි සන්ධර්භයක ස්ථාන ගත කරමින් විධිමත්ව සහ කඩිනමින් සංරක්ෂකය කිරිම සිදු කළ යුතුය. ඒසේම අනුරාධපුරය සහ දීඝවාපිය වැනි ස්තූප ආයකයන් දෙස අවදානය යොමු කිරීමේදී පෙනි යන්නේ අනුරාධපුර යුගයේ එනම් ක්‍රිස්තු වර්ෂ 01-10 අතර කාලයේදී ඉදිකරන ලද ආයකයන් අලංකරණය උදෙසා විවිධ කැටයම් සහ මෝස්තරයන් භාවිත කර තිබෙන බවයි. නමුත් යඨාලතිස්ස ආයකය තරමක් අලංකාර බවින් තොරවන බව උපකල්පනය කිරීමට හැකිය. එසේ උපකල්පනය කරනු ලබන්නේ ආකය ආසන්නයෙන් හමුවන කැටයම් ප්‍රමාණය ඉතාමත් සීමිතවන බැවිනි.

ආශ්‍රිත ග්‍රන්ථ


Schloedr, Ulrich, Von. (1990). ***Buddhist Scupture of Srilanka***, Visual Dharma publication ltd, Honkong.

Prematilleke, L. (1980**).** “ The Sculptural Remains of the stupa Vahalkadas” , **P.E.P. Daraniyagala Commemoration Volume**, ed, Thelma Gunwardhene and Others , Colombo: Lakae House Invesment Ltd. Pag



ඡායාරූප අංක 01
යඨාලතිස්ස ආයකය
අනුමාන කුවේර කැටයම
01



ඡායාරූප අංක 02
යඨාලතිස්ස ආයකය
අනුමාන කුවේර කැටයම
02



ඡායාරූප අංක 03
යඨාලතිස්ස ආයකය
අනුමාන කුවේර
කැටයම 01



ඡායාරූප අංක 01
යඨාලතිස්ස ආයකය
අනුමාන කුවේර
කැටයම 01